WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| ක්‍රිස්තියානි ධර්මය I, II | | පැය තුනයි |
| கிறிஸ்தவம் I, II | | மூன்று மணித்தியாலம் |
| Christianity I, II | | Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ක්‍රිස්තියානි ධර්මය I

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ඇදහිල්ලේ පියා ලෙස බයිබලයේ සඳහන් වන්නේ කවුද?
(1) මෝසස් (2) ආබ්‍රහම් (3) එලියා (4) දාවිත්

**2.** ජාති, ආගම් හෝ කුලභේද නොතකා අවශ්‍යතාව ඇති කෙනෙකුට පිහිටවීමේ වැදගත්කම ඉදිරිපත් කෙරෙන උපමා කථාව වන්නේ කුමක් ද?
(1) පරිසියා සහ අයකැමියා (2) නැති වූ බැටළුවා
(3) යහපත් සමාරිතයා (4) අකීකරු පුත්‍රයා

**3.** ලාදුරු රෝගීන් දස දෙනෙකු සුව කිරීමේ සිද්ධිය මගින් අප ලබන අනුශාසනාව කුමක් ද?
(1) රෝගී අවස්ථාවේ දෙවියන්ට කියා පෑම
(2) අපගේ සියලු අවශ්‍යතා යාච්ඤාවෙන් පමණක් ලබා ගැනීම
(3) යාච්ඤාව මගින් පමණක් සුවය ලැබෙන බව ඒත්තු ගැනීම
(4) අවශ්‍යතා සහ සුවය ලැබූ විට දෙවියන්ට ස්තුති දීමේ වැදගත්කම

**4.** දෙවියන් වහන්සේට අයත් වූවන් ලෙස පිළිගැනීමට ජුදෙව්වන් ක්‍රියාත්මක කළ චාරිත්‍රය වන්නේ,
(1) චර්ම ඡේදනය කිරීමයි. (2) කැපකිරීමයි.
(3) බෞතිස්ම කිරීමයි. (4) වයස අවු.12 දී දේව මාළිගයට ගෙන යෑමයි.

**5.** මෙසියස් තුමාගේ පැමිණීම කලින් දැනුම්දීමට දෙවියන් වහන්සේ ක්‍රියා කළේ කවුරුන් මගින් ද?
(1) රජවරු (2) දිවැසිවරු (3) පූජකවරු (4) ලෙවීවරු

**6.** ස්නාවක ජොහන්ගේ උපත නිමිත්තෙන් ඔහුගේ දෙමාපියන්ට අවධාරණය වූයේ කුමක් ද?
(1) අත්හැර නොදැමීමයි.
(2) අසල්වැසියන්ට සවන් දීමයි.
(3) දෙවියන් වහන්සේට කළ නොහැකි දෙයක් නැත යන්නයි.
(4) ඉතා සරල ජීවිතයක් ගත කිරීමයි.

**7.** සිමියොන්ගේ ප්‍රශංසාවෙන් අපට වැටහෙන්නේ,
(1) ජුදා දේශයේ සැමගේ මහිමය මෙසියස් මගින් බවයි.
(2) මෙසියානු උපතට වැඩිහිටියන් දායක වූ බවයි.
(3) චාරිත්‍ර නිසි ලෙස පවත්වාගෙන යා යුතු බවයි.
(4) මෙසියස් වහන්සේගේ ගැළවීම විශේෂ කොටසකට සීමා නොවන බවයි.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**8.** කොබෙයියන් දෙදෙනෙක් ඔප්පු කිරීම මගින් මරියතුමියගේ කෙබඳු පසුබිමක් අපට අනාවරණය කෙරේ ද?
(1) එතුමිය යුදා චාරිත්‍ර අනුගමනය කරන්නියක් වූ බව
(2) ඇය දිළිඳු තැනැත්තියක් වූ බව
(3) සිය පුතණුවන් ගලවා ගැනීමේ ප්‍රයත්නයක් දැරූ බව
(4) ඉහත (1), (2), (3) හි සඳහන් සියලු ලක්ෂණ ඇය සතු වූ බව

**9.** ස්නාවක ජොහාන් ඉදිරිපත් කළ හෙරොද් රජුගේ පාපය ලෙස දැක්වෙන්නේ කුමක් ද?
(1) ඊජිප්තුව යටත් කරගැනීමේ ප්‍රයත්නය
(2) ඔහුගේ සොහොයුරාගේ බිරිඳ විවාහ කර ගැනීම
(3) බෙත්ශීබා විවාහ කර ගැනීම
(4) අන්‍ය ජාතික කාන්තාවක් විවාහ කර ගැනීම

**10.** නාසරත් ප්‍රකාශනයේ දැක්වෙන දේව රාජ්‍ය පිළිබඳ වැදගත්ම ගුණාංගය වන්නේ,
(1) යුක්තිය සහ ධර්මිෂ්ඨකමයි.
(2) සුව කිරීම සහ රැකබලා ගැනීමයි.
(3) ධර්මිෂ්ඨකම සහ සානුකම්පාවයි.
(4) යුක්තිය සහ සුව කිරීමයි.

**11.** මහලේ රෝගයෙන් පෙළුන ස්ත්‍රිය සුවපත් වීමේ සිද්ධියෙන් අපට උගන්වන ප්‍රායෝගික පාඩම කුමක් ද?
(1) සාමාන්‍ය අසනීපයෙන් පෙළෙන අය වෙනුවෙන් සේවය කිරීම
(2) කීර්තියට කැළලක් වන රෝගීන් අතර සේවයේ යෙදීම
(3) බෝවන රෝග ඇති අය මධ්‍යයේ සේවය කිරීම
(4) අසාධ්‍ය රෝග ඇති අය අතර සේවයේ යෙදීම

**12.** පහත සඳහන් ඒවා අතුරින් ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ වූ ජුදෙව් ආගමික නායකත්වය විරෝධය පළ කිරීමට හේතු මොනවා ද?
A - යුක්තිය හා සාධාරණත්වය මත පිහිටා නීතිය අර්ථකථනය කළ නිසා ය.
B - දේව මාලිගයේ නායකයින් අතර ජේසුස් වහන්සේගේ ජනප්‍රියභාවය පැතිරීම නිසා ය.
C - ජුදෙව් නායකත්වයට ජේසුස් වහන්සේ අයත් නොවූ නිසා ය.
D - දේශපාලන වරප්‍රසාද අත්කර ගැනීමේ ඔවුන්ගේ අදහස් අනාවරණය වූ නිසා ය.
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

**13.** ජේසුස් වහන්සේ කුරුසිපත් වීමට වරදකරු ලෙස තීරණය වීම, අද සමාජයේ හා ලොවෙහි සංස්ථා මගින් පිළිබිඹු වන්නේ,
(1) නිදොස් අය වරදකරුවන් බවට පත්වීමයි.
(2) වරදකරුවන් නිදහස් වීමයි.
(3) අයුක්තිය නිසා වරදකරුවන් නිදහස් වීමයි.
(4) නිදොස් අහිංසකයන් වරදකරුවන් බවට පත්වන අතර වරදකරුවන් නිදහස් වීමයි.

**14.** පැල්පත් වාසීන් නගා සිටුවීමේ ප්‍රයත්නයක යෙදුනේ,
(1) දේවගැති චන්ද්‍රා ප්‍රනාන්දු ය.
(2) දේවගැති තිස්ස බාලසූරියයි.
(3) දේවගැති මයිකල් රොඩ්රිගෝ ය.
(4) දේවගැති පීටර් ජෙරාඩ් ද සිල්වා ය.

**15.** ජේසුස් වහන්සේ මෙසියස් තුමා ලෙස පිළිගැනීමට ජුදෙව්වන්ට බාධාවක් වූයේ එතුමා
(1) දිව්‍යසිවරයෙක් ලෙස සැලකීම නිසා ය.
(2) ගව ලෙනක ඉපදීම නිසා ය.
(3) රජ කෙනෙකු ලෙස අනන්‍යතාව දැක්වීම නිසා ය.
(4) කන්‍යාවක කුළින් බිහිවීම නිසා ය.

**16.** පහත සඳහන් ඒවා අතුරින් මරියතුමී සහ එලිසබෙත්ගේ චරිත මගින් දෙවියන් වහන්සේ අපට ඉදිරිපත් කරන ඉගැන්වීම් මොනවා ද?
A - වයස හා කාලය දේව සැලැස්මට බාධාවක් නොවන බව ය.
B - දේව සැලැස්ම වයස් ගත වූවන් මගින් එළිදරව් කිරීම ය.
C - දේව සැලැස්ම නිතරම දේව දූත පණිවුඩයක් මගින් අනාවරණය කිරීම ය.
D - දේව සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී දෙවියන් වහන්සේ මනුෂ්‍යයන්ද සහභාගි කරගන්නා බව ය.
(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා D

**17.** දේව රාජ්‍යයේ පුරවැසියෙක් ලෙස ඔබ නායකත්වය ක්‍රියාත්මක කළ යුත්තේ කෙසේ ද?
(1) සේවය ලැබීමට නොව සේවය කිරීම සඳහායි.
(2) තමාට සේවයක් කරගන්නා අතර අන්‍යයන්ට ද සේවය කිරීමටයි.
(3) තමාට සේවයක් ලබා ගන්නා බලාපොරොත්තුවෙන් අන් අයට සේවය කිරීමයි.
(4) සෙසු නායකයන්ට සේවය කරන අතර තමාට ද සේවය කර ගැනීමයි.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

18. ආලේප ලත් රජෙක් පාලනය කළ යුත්තේ,
(1) ධනවතුන් සඳහා ප්‍රේමයෙන් හා යුක්තිය ඉටුකිරීමෙන් ය.
(2) ප්‍රේමය, යුක්තිය සහ ධර්මිෂ්ඨකමින් පාලනය ගෙන යෑමෙන් ය.
(3) සිය මිතුරන් උදෙසා ප්‍රේමයෙන් සහ යුක්තියෙන් පාලනය කිරීමෙන් ය.
(4) සිය පවුල සඳහා ප්‍රේමය හා යුක්තිය ඉටුකිරීමෙන් ය.

19. මෙසියස්තුමාගෙන් අපට ලැබෙන්නේ,
(1) පරිපූර්ණ ජීවිතයකි. (2) සෞභාග්‍යමත් ජීවිතයකි.
(3) සුවය සහ සනීපය ඇති ජීවිතයකි. (4) අප අවට සිටින අය සමඟ ජීවිතයකි.

20. පාසලේ සෙසු ශිෂ්‍යයන් සමග යහපත් එඩේරෙකු ලෙස ඔබ ක්‍රියා කරන්නේ කෙසේ ද?
(1) විදුහල්පතිතුමා මබ පිළිබඳ දැනගන්නා ලෙස ක්‍රියා කිරීමෙනි.
(2) තමා නායකත්වයේ සිටින ලෙස ක්‍රියා කිරීමෙනි.
(3) අන් අය තමා කෙරෙහි පිළිගැනීමෙන් සිටින ලෙසිනි.
(4) කිසිවෙක් අත් නොහැර සියලු දෙනා රැකබලා ගැනීමෙනි.

21. ආදායමක් නොමැතිව ජීවිත අරගලයක සිටින පුද්ගලයෙකු සඳහා ප්‍රේමය දැක්වීමේ සුදුසුම ක්‍රියාවලිය වන්නේ,
(1) තම මුදලින් ඔහුට සහාය වීමයි.
(2) සමාජ ආධාර සමිතියකට බැඳීමට සහාය දීමයි.
(3) මුදල් උපයා ගත හැකි යම් මගක් සලසා දීමයි.
(4) මිතුරන් අතර ඔහුගේ තත්ත්වය කියා පෑමයි.

22. අවිනිශ්චිත භාවයෙන් පෙළෙන ජනතාව අතර කිතුනුවකු ලෙස වගකීමේ ක්‍රියාමාර්ගය විය යුත්තේ,
(1) බලාපොරොත්තුව ඇතිකර ගැනීමට දිරි දීමයි.
(2) අසුබවාදීභාවය ව්‍යාප්ත කරගැනීමට දිරි ගැන්වීමයි.
(3) නිර්බාධක ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමයි.
(4) දේශපාලන පිහිට සෙවීමට අනුබල දීමයි.

23. 'සභාව' යන්නෙන් ඔබ වටහා ගන්නේ කුමක් ද?
(1) සභා සංවිධානයක් බව (2) සභා කවුන්සිලයක් බව
(3) ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය බව (4) පූජකවරුන්ගේ එකතුවක් බව

24. පහත සඳහන් ඒවා අතුරින් පීඩිතවූවන් සහ සමාජයේ කොන්වූවන් උදෙසා කිතුනුවන් ලෙස ගතහැකි ක්‍රියාමාර්ග වන්නේ මොනවා ද?
A - නීති ආධාර දෙන මධ්‍යස්ථාන පිහිටුවීමයි.
B - ඔවුන්ගේ අවශ්‍ය කාර්යයන් සපුරාලන අන්තර් ආගමික ජාලයක් පිහිටුවීමයි.
C - දේවස්ථාන ඉදි කිරීමයි.
D - ඔවුන් අවමානයට ලක් කෙරෙන කණ්ඩායම් බිහි කිරීමයි.
(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා D

25. "මොහු ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි. මැය ආබ්‍රහම්ගේ දියණියකි." මෙලෙස ජේසුස් වහන්සේ පැවසුවේ පහත සඳහන් කුමන දෙදෙනා පිළිබඳව ද?
(1) ජෝසප් සහ මරියතුමිය (2) සිමියොන් සහ අන්නා
(3) සාකෙවුස් සහ කුදු ස්ත්‍රිය (4) පරිසියා සහ පව්කාර ස්ත්‍රිය

26. පහත සඳහන් ඒවා අතුරින් අන්‍ය ජාතීන් අතර දහම් සේවයේදී පාවුල්ට පිටිවහලක් වූ පසුබිම් සාධක වූයේ මොනවා ද?
A - වාණිජ මධ්‍යස්ථානයක් වූ තාර්සස්හි ඉපදීමයි.
B - සිනගෝගවලින් ලැබූ දැනුමයි.
C - ජුදෙව් නීතිය පිළිබඳ දැනුමයි.
D - තර්සස්හි විවිධ ජාතීන්, භාෂා හා සංස්කෘතීන්ගේ ආභාෂය ලැබීමයි.
(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

27. නිකදෙමුස් රාත්‍රි කාලයේ ජේසුස් වහන්සේ හමුවීමට ගියේ
(1) තමා අයත් සෙසු පරිසි කණ්ඩායම පිළිබඳව තිබූ බිය නිසා ය.
(2) අධ්‍යාත්මික ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගැනීමට ය.
(3) ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ වෙතින් හෝ ආබ්‍රහම්ගෙන් වැඩම කළ බව සෙවීමට ය.
(4) ගුරුවරයෙක් ලෙස තම ඉගැන්වීම්වලට සහය ලබා ගැනීමට ය.

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

28. දුක් විඳින සේවකයාණෝ ආදර්ශයට ගන්නා කිතුනු අප කළ යුත්තේ
(1) තම ජීවිත රැක ගැනීමේ ප්‍රයත්නයක යෙදීමයි.
(2) දුක් විඳීම හා පූජා වීම අන්අයගෙන් බලාපොරොත්තු වීමයි.
(3) ලෝකයෙන් පැමිණෙන පීඩා හා කරදර මගහැරීමට ක්‍රියාකිරීමයි.
(4) දුක් හා පීඩා මධ්‍යයේ ඇදහිල්ලෙන් හා ධෛර්යයෙන් ක්‍රියාකිරීමයි.

29. “ජීවමාන තැනන් වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද?” මෙම ප්‍රකාශයෙන් කිතුනු අප ලබන පණිවිඩය වන්නේ,
(1) සොහොන වෙත ගිය කාන්තාවන් මෙන් සතියේ පළමු දා දේවස්ථානයට යෑමයි.
(2) ජේසුස් වහන්සේ ජීවමානව අප අතර වැඩ වසන බව ඒත්තු ගැනීමයි.
(3) දේව දූතයන් නිතර මෙබඳු පණිවුඩ ගෙන දෙන බව තේරුම් ගැනීමයි.
(4) සොහොන මෙන් අපගේ සිත් හිස් බව වටහා ගැනීමයි.

30. ගෙත්සෙමන උයනේ ජේසුස් වහන්සේගේ යාච්ඤාවක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) “ඔබ උදෙසා දෙන ලද මාගේ ශරීරය මේ ය.”
(2) “මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා.”
(3) “මෙම කුසලාන මාගෙන් පහ කළ මැනව.”
(4) “පරික්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න.”

31. ‘ක්‍රිස්තියානි’ යන නම මුලින්ම දෙනු ලැබුයේ,
(1) ජෙරුසෙලමේ දේව මාළිගාවේදී ය.
(2) නාසරත්හි සිනගෝගයේදී ය.
(3) සිරියාවේ අන්තියෝකයේදී ය.
(4) සිලිසියාවේ තාර්සස්හිදී ය.

32. පහත සඳහන් වගුව සලකා බලන්න.

| ජේසුස් වහන්සේ මුහුණ පෑ පරික්ෂාවක් | වත්මන් සමාජයේ අප මුහුණපාන එවැනි පරික්ෂා | පරික්ෂා ජය ගැනීමට කිතුනු ප්‍රතිචාරය විය යුත්තේ |
|---|---|---|
| මා ඉදිරියේ නමස්කාර කළහොත් ලෞකික ආධිපත්‍යය ඔබට පවරාදෙමි. | ධනය, බලය, කීර්තියට එළඹීමේ අපේක්ෂාව | A - පරික්ෂා දේව කැමැත්ත බව පිළිගැනීම |
| | | B - ධනය, බලය මගින් ජයග්‍රාන්විත වීම |
| | | C - යාච්ඤාව මගින් දේව කැමැත්තට හිස නැමීම |
| | | D - දේව වචනය මගින් පරික්ෂා ජය ගැනීම |

ඉහත ප්‍රතිචාර අතුරින් වඩාත් නිවැරදි කිතුනු ප්‍රතිචාර අඩංගු පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

33. පාසල් කිතුනු ශිෂ්‍යයෙකු වශයෙන් ඔබේ ප්‍රධානතම වගකීම විය යුත්තේ
(1) කිතු දහමෙහි විශේෂත්වය පිළිබඳ කියා පෑමයි.
(2) කිතුනු ආකල්ප හා අගයයන් අනුව සාක්ෂි දැරීමයි.
(3) තම හැකියාවන් උපරිම ලෙස වර්ධනය කර ගැනීමයි.
(4) අන් සිසුන්ගේ ක්‍රියාකාරකම් විවේචනාත්මකව සොයා බැලීමයි.

WWW.OLEVELAPI.COM

34. ආමෝස් සහ මීකා දිවැසිවරු දෙදෙනාගේ ක්‍රියාකාරකම් මගින් වර්තමානයේ අප ලබන පන්නරය විය යුත්තේ මොනවාදැයි දැක්වෙන පිළිතුර තෝරන්න.
A - ජනතාව අතර චාරිත්‍ර වර්ධනය කිරීමයි.
B - සමාජ සාධාරණත්වය උදෙසා විශේෂයෙන් ක්‍රියාකිරීමයි.
C - ඉරු දින පිවිතුරු දිවියක් ගෙවීමේ වැදගත්කම දැක්වීමයි.
D - සාමය උදෙසා කැප වී ක්‍රියාකිරීමේ වැදගත්කමයි.
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

35. “මනුෂ්‍යයනි, ඔබ මේ දේවල් කරන්නේ මන්ද? අපිත් ඔබ හා සමාන මිනිස්සු ය.” පාවුල් සහ බර්නබස් මෙලෙස ප්‍රකාශ කළ අවස්ථාව මගින් අප අනුගත කළ යුත්තේ,
(1) දෙවියන් වහන්සේට හිමි ගෞරවය අපට නොව එතුමාට පුද කිරීමයි.
(2) පුද පූජාවලින් වැළකී සිටීමේ අවශ්‍යතාවයි.
(3) හාස්කම් කිරීමේ ප්‍රතිවිපාක ඒත්තු ගැන්වීමයි.
(4) ජේසුස් වහන්සේ පිළිබඳ නොදැන කරන ක්‍රියාවන් අනුමත

[පස්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**36.** "නොසිතූ ලෙස නොසිතූ අවස්ථාවක ජේසුස් වහන්සේ වෙනුවෙන් දයාවේ සේවයකට ඇරයුම ලැබිය හැකි ය." යන්න සනාථ වන්නේ,
(1) සාකෙවුස් ධනය බෙදීමේ ක්‍රියාකලාපයෙන් ය.
(2) අරමාතියේ ජෝසප්ගේ ක්‍රියාකලාපයෙන් ය.
(3) කිරේනියේ සීමොන්ට ලැබූ බල කිරීමට ඔහු ප්‍රතිචාර දැක්වූ අන්දමින් ය.
(4) ජෙරුසලමේ කාන්තාවන් කුරුසිය වෙත රැඳී සිටීමෙන් ය.

**37.** කිතුනු අප ජේසුස් වහන්සේ නැමැති සැබෑ මිදිවැලට ඒකාබද්ධ විය යුත්තේ,
(1) බහුවිධ සමාජයේ යහපත් ඵල දරමින් ඒකත්වයට නැඹුරුවීමටයි.
(2) සමෘද්ධිමත් ජීවිතයකට මග පාදා ගැනීමටයි.
(3) මුල් කිතුණු සභා මෙන් ජීවිත පදනම් කර ගැනීමටයි.
(4) ලාංකික සමාජයේ වටිනාකම් එක්රැස් කිරීමටයි.

**38.** පහත සඳහන් ඒවා අතුරින් යහපත් එඬේරන් ලෙස වත්මන් කිතුනු සභා නායකයන්ගෙන් අප බලාපොරොත්තු වන්නේ මොනවා ද?

A - නිවාස අහිමි අයට නිවාස ගොඩනගා දීමයි.
B - දේව වචනයේ සත්‍යතාවය පහදා සභාව පෝෂණය කිරීමයි.
C - සභාවෙන් විසිර ගොස් නැතිවූවන් ආපසු ගෙන ඒමයි.
D - සභා සාමාජිකත්වය හැකිතාක් දුරට වර්ධනය කිරීමයි.

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**39.** 'පොළොව ගැඹුරට කැණ පර්වතය මත අත්තිවාරම දැමීම' යන දෙව් වදනින් අපට දෙන අනුශාසනය වන්නේ,
(1) නිවසක් තැනීමේදී නිසි අත්තිවාරමක් දැමීමේ වැදගත්කමයි.
(2) පොළොව ගැඹුරට කැණීමෙන් ගොඩනැගිල්ල ශක්තිමත් වන බවයි.
(3) කිතුනු ජීවිත ජේසුස් වහන්සේ නැමැති පර්වතය මත ගොඩ නැඟීම වැදගත් බවයි.
(4) ව්‍යාපාරයක් හෝ ආයතනයක් ඇරඹීමේදී පදනම ගැන සොයා බැලිය යුතු බවයි.

**40.** "දෙවියන් වහන්සේට කීකරු වීමට වඩා ඔබට කීකරු වීම හරි ද?" පේදුරු සහ ජොහන් ජුදෙව මන්ත්‍රණ සභාව ඉදිරියේ කළ මෙම ප්‍රකාශ මගින් කිතුනු අප වටහා ගත යුත්තේ,
(1) නිර්භයව තම ශක්තිය හා බලය දැක්වීමට අවස්ථාව ගැනීමයි.
(2) අපේ දැනුම ප්‍රයෝජනයට ගෙන අවස්ථාවෝචිතව කථා කිරීමයි.
(3) ජනතාව හා නායකයන් ඉදිරියේ ජයාන්විත වීමේ වැදගත්කමයි.
(4) අභියෝගාත්මක අවස්ථාවල ශුද්ධාත්ම මගපෙන්වීමෙන් නොසැලී ඉදිරිපත් වීමයි.

* *

WWW.OLEVELAPI.COM

[ගයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...